# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/69 - 2021 අගෝස්තු මස 07 වැනි සෙනසුරාදා - 2021.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, කිරිඇල්ල නව ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යවී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/RN/83.

2021 අගෝස්තු මස 04 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

1A - G 34809 — 31 (2021/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාටුවාගල අංක 149A ග්‍රාම නිලධාරි වසමේ මාටුවාගල ගමේ මාටුවාගල වත්ත නමැති ඉඩමෙන් අක්කර 01 රූඩ් 02ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : මාටුවාගල වත්ත ;
*නැගෙනහිරට* : මාටුවාගල වත්ත ;
*දකුණට* : මාටුවාගල වත්ත ;
*බටහිරට* : මාටුවාගල වතු පාර.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : බලංගොඩ වැවිලි සමාගම,
පාම් ගාර්ඩ්න්,
රත්නපුර.

08 - 320

---

**ශුද්ධි පත්‍රය**

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2181/28 හා 2020.06.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවේ හා 2A පිටුවේ අංක 07 - 329 යටතේ පළ කරන ලද නිවේදනයේ, ඉඩම අත්කර ගැනීමට යෝජිත කාර්ය ගම්පහ. අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමය යටතේ බස්නාගොඩ ජලාශය නිසා බලපෑමට ලක්වන ජනතාව නැවත පදිංචි කිරීමට යෝජිත ඉඩම සඳහා ප්‍රවේශ මාර්ග සකස් කිරීමට ඉඩම් කොටසක් අත්කර ගැනීම යනුවෙන් සඳහන් කර ඇතත්, එය ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමය යටතේ බස්නාගොඩ ජලාශය නිසා බලපෑමට ලක්වන ජනතාව නැවත පදිංචි කිරීමට යෝජිත ඉඩමේ ප්‍රවේශ මාර්ගය සඳහා භාවිතා කළ මාර්ගයෙන් කොටසක් අත්පත්කර ගැනීම යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/GQ/76.

2021 ජූලි මස 29 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැඳුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

08 - 321

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.